# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2064/19 – 2018 මාර්තු 27 වැනි අඟහරුවාදා – 2018.03.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 55 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2017/යූඩීජ්/500.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: එම්ඕආර්/එල්ඒඑන්/01/එෆ්1/214.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ජේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ජේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 මාර්තු මස 23 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, මොරටුව.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුව සුළු කොට්ඨාසයේ, කටුබැද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එම්ආර්ටී/2018/04 හා 2018.01.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ප්‍රමාණය: හෙක්. 0.0729**
උතුරට: ශ්‍රී රාහුල මාවත සහ පී. ජී. අනිල් හිමිකම් කියන දෙල්ගහවත්ත නොහොත් බැටරිවත්ත; නැගෙනහිරට: පී. ජී. අනිල් හිමිකම් කියන සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි දෙල්ගහවත්ත නොහොත් බැටරිවත්ත; දකුණට: කැබලි අක්ෂර බී, සී සහ රජය හිමිකම් කියන ශ්‍රී රාහුල මහා විද්‍යාලය; බටහිරට: තෙන්නකෝන් මුදියන්සේලාගේ වර්ණරත්න සහ තවත් අය හිමිකම් කියන සපුගහවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – දෙල්ගහවත්ත නොහොත් බැටරිවත්ත, වරි. අංක 366, ශ්‍රී රාහුල මාවත – ප්‍රමාණය: හෙක්. 1.3942**
උතුරට: කැබලි අක්ෂර ඒ සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි දෙල්ගහවත්ත නොහොත් බැටරිවත්ත; නැගෙනහිරට: බොල්ගොඩ ගඟ; දකුණට: සිමෙන්ති කාණුව, රජය හිමිකම් කියන දන්දෙනියවත්ත, ප්‍රවේශ මාර්ගය සහ කැබලි අක්ෂර සී; බටහිරට: කැබලි අක්ෂර සී.

03. **කැබලි අක්ෂර 'සී' – ප්‍රමාණය: හෙක්. 0.0735**
උතුරට: කැබලි අක්ෂර ඒ සහ බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී සහ ප්‍රවේශ මාර්ගය; දකුණට: ප්‍රවේශ මාර්ගය සහ කපන ලද කාණුව; බටහිරට: කපන ලද කාණුව සහ රජය හිමිකම් කියන ශ්‍රී රාහුල මහා විද්‍යාලය.

04 - 422



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*